ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2013 දෙසැම්බර් 23 සඳුදා
06 වෙළුම - 08 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 52/ News/ 2013

# ළමා ප්‍රදීපය

පාඨක හා ලේඛක

මිල රු 10/-

## පුංචි ඔබ සැමට සුබ නත්තලක් වේවා !



Photos By: ASHEN S. SENARATHNA SLC

## පුංචි අපිත් මෙවර නත්තල අපේම ජීවිත පණිවිඩයක් කර ගනිමු !

Lama Pradeepaya

ළමා ප්‍රදීපය
ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# ඔබ සැමට සුබ නත්තලක් වේවා!

**ආදරණීය දුවේ පුතේ...**

මෙවර ළමා ප්‍රදීපය කවරයේ පිංතූරය දිහා ඔබ හොඳට බලන්න. ඔබේම වයසේ පුංචි දරුවන් පිරිසක් ගවලෙනක් ඉදිරිපිට කරන මෙනෙහි කිරීම ඔබට පෙනෙනවා නේද? මෙවර නත්තල උදවත් සමඟම ඔබට සමීප ඔබ නිර්මාණය කරන ගවලෙන වෙතට ගොස් ජේසු බිළිඳුන් සමඟ ඔබ කථා කරන්න ඕනා. මෙනෙහි කරන්න ඕනා.

ඔබට සිතට නැගෙන ඔබේම සිතිවිලි හැකි විගස නව වසරේ ළමා ප්‍රදීපයට ඔබ යොමු කරන්න ඕනා. ඒ නිසා ආදර දුවේ පුතේ, මෙවර ඔබ නිර්මාණය කරන ගවගෙනට අළුත් අර්ථයක් ලබා දෙන්න ළමා ප්‍රදීපය සූදානමින් සිටිනා බව අමතක කරන්න එපා.

භාග්‍යවත් නත්තලක් ඔබ සැමට පතනවා.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

## අපෙන් ආසිරි



**සියළුම ළමා ප්‍රදීපය පාඨක, ලේඛක, කියවන සියළුම දූ පුතුන්ට සිහි කරමින් ලබන්නාවූ නත්තල භාග්‍යවත්, අසිරිමත් ප්‍රිතිමත් නත්තලක් වේවායි ඔබ සැමට අපි මෙලෙස ප්‍රාර්ථනා කරන්නෙමු.**

**සංස්කාරක :- ගරු සාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා ,**
**සහය සංස්කාරක :- කුමර නයනජිත් , ශිරාන් මෛත්‍රි මාමලා ,**
**පිටු සැකසුමෙන් :- තිළිණ අලහකෝන් මාමා ක්‍රිෂාන්ති පෙරේරා හා**
**පරිගණක සැලසුමෙන් :- තරුෂිකා ප්‍රනාන්දු නැන්දලා**

# අරුත්බර නත්තලකට ඇරියුමක් !

කිතුනු දහම පැතිරිලා ගිය හැම රටකම නත්තල් උත්සවය ඉතාමත් උත්කර්ෂවත් ලෙස පවත්වනවා. පෘතුගීසින්ගේ පැමිණීමෙන් පසුව ක්‍රිස්තු දහම පැතිරීගිය දවසේ ඉඳල මේ රටේ නත්තල් උත්සවය පවත්වන්නට පටන් ගත්ත. නත්තල කියන වචනයේ තේරුම උපත යන්නයි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපතයි. නත්තල කියන වචනය හැදිල තියෙන්නෙ නතාල් යන පෘතුගීසි වචනයෙන්. ලතින් භාෂාවෙන් එය නටාලිස් යනුවෙන් හඳුන්වනවා. ඉතාලි භාෂාවෙන් ඉල්නටාල් කියනවා. ඉංග්‍රීසි භාෂාවෙන් කියන ක්‍රිස්මස් වචනය මුලින්ම භාවිත වුනේ ක්‍රිස්ට් මසේ යනුවෙනුයි. එහි තේරුම ක්‍රිස්තු පූජාව යන්නයි.

ඉතින් දුවේ, පුතේ රෝමය පුරාම ජනලේඛනයක් පිලියෙල කිරීමට එදා එහි අග රජව සිටි සේසරු අගොස්තුස් තුමා නියෝගයක් නිකුත් කළා. ඒ නිසාම සෑම රටවැසියෙක්ම තම තමනගේ ගම් බිම් බලා පිටත් වුණා. අප ආදර දේව අම්මාත් සුරුකි පියා ජුසේ තුමාත් සමග සිය උපන් ගම වූ ගලීලයේ නාසරෙත් සිට සැතපුම් අනූ පහක් පමණ දුරින් පිහිටි බෙත්ලෙහෙම බලා පිටත් වුණා. දුවල පුතාල දන්නවද මේ විශාල දුර මෙතුමන්ලා ගියේ පයින්මයි. මේ යන ගමනේදී මරිය තුමිගේ සහ ජුසේතුමාගේ සිතේ තවත් ආශාවක් තිබුණා. ඒ තමයි කාලයකින් නොදුටු නෑදෑ හිතවතුන්වත් බැලීම. ගර්භනී මාතාවක් වූ මරියතුමිය මේ වගේ ඉතාමත් දුර ගමනක් යෑම ගතට විශාල වෙහෙසක් ගෙන දුන්නත් ආරම්භ කළ ගමන කොහොමහරි අවසානය දක්වා යන්නට සිතට දිරිය ගත්තා. දින කිහිපයක්ම මේ විදියට ඉතාමත් අමාරුවෙන් අපහසුවෙන් ගමන් කළ මරියතුමියත් ජුසේතුමාත් එක් හැන්දෑවක බෙත්ලෙහෙමට පැමිණියා. ඒ වෙනකොට මුළු නගරයම ජනයාගෙන් පිරිලා. ඉතින් මේ දෙදෙනා නවාතැනක් සොයමින් තානායම්වලට හෝටල්වලට ගියා. අනේ කිසිම තැනක ඉඩක් ලැබුනේ නැහැ. අන්තිමේදී මේ දෙදෙනාට රැය ගත කරන්නට ගවයින් ලගින කුඩා මඩුවක් ලැබුණා.

— — — — — — — — — —

**තෑගී ලබන්නට බිළිඳුගේ පටන් වයෝවෘද්ධයා දක්වා තරාතිරමක් නොමැතිව කැමැත්තක් දක්වයි එයින්ද දරුවන් සුවිශේෂී වෙයි. නත්තලේ දී ඇති හැකි පවුල් වල දූ දරුවන්ට "තෑග්ගෙන් තෑග්ග උතුම්" ය යන සංකල්පය අනුව නැති බැරි පවුලක දරුවෙකුට හෝ කීපදෙනෙකුට තම දෙමාපියන් ගේ කැමැත්ත ඇතිව "නත්තල් තෑග්ග"ක් බැගින් පිරිනැමිය හැකි නම් එය කොතරම් අගනේද? ඔබ වගේම දිළිඳු දරුවන් ද නත්තලේ සතුට විඳ දරා ගන්නට කැමැති බව මෙනෙහි කරන්න. පරාර්ථකාමීව සිතා බාලවියේ සිට මෙවැනි දේ ගැන ඔබේ සිත යොමු කරවීම දෙමාපිය වැඩි හිටියන්ගේද යුතුකම කි**

**ආදර දුවේ පුතේ ඔබට විශාල දේවල් කළ නොහැකි වන්නට පුළුවන් වුවත් මෙවන් පුංචි දෙයකින් ඔබේ සතුට සෙසු අය සමඟ බෙදා හදා ගැනීමට පුළුවනි. ඔබ ලස්සන ලස්සන**

විපතේදී පිහිටවීම උතුම් ගුණයක් බව මිනිසුන්ටත් වඩා තිරිසන් සතුන් හොඳින් හඳුනාගෙන ඇති හෙයින් මරියතුමිය හා ජුසේතුමා ගවමඩුවට ඇතුළුවූ වහාම ගවයින් එතැනින් ඉවත්වෙලා පිටතට ගිය බව පැවසෙනවා. දුවේ පුතේ කොතරම් අපූරු සිදුවීමක්ද එය. ඒ තිරිසන් වූ ගවයින්ගේ ක්‍රියාව අප හොඳින් මතක තබාගන්න ඕන අපේ ජීවිත ගමනට වැදගත්වන නිසා. ජුසේතුමා පුළුවන් විදියට ගවමඩුව පිරිසිදු කරල ගව ඔරුවත් පිරිසිදු කරල ඊට පිදුරු දමල රෙදිකඩකුත් අතුරල දෙවි බිළිඳාට සැතපෙන්නට පිළියෙල කළා. එදා රෑ අධික සීතල මැද ලෝකයට සාමය ගෙනා ජේසු බිළිඳා ඉපදුණා. ඒ දෙවි පියාණන්ගේ කැමැත්ත හා සැළසුමයි.

ඉතින් ආදර දුවේ පුතේ, අපත් දෙවිපියාණන්ගේ කැමැත්ත අනුව ක්‍රියාකිරීම දෙවිපියාණන් අපෙන් බලාපොරොත්තු වෙනවා. අපහසුතා දුෂ්කරතා දරාගෙන ඔබේ අම්ම තාත්ත ඔබ වෙනුවෙන් කරන කැපවීමට ආදරයෙන් ඇතුළුවන්න. දෙමාපියන්ගේ සිත් රිදෙන විදියට කතා කරන්න එපා. එලෙස හැසිරෙන්න එපා. පවුල තුළ මුදල් ප්‍රශ්න හා වෙනත් අපහසුතා දුෂ්කරතා බොහොම තියෙනවා. ඒ නිසාම සමහරවිට අම්ම තාත්තගෙන් දුවල පුතාලට අඩුපාඩු සිදුවෙනවා. ඒවා සුබ සිතින් ජේසු වෙනුවෙන් දරාගෙන ලැබෙන දෙයින් සතුටුවෙන්න. ඒ අයට ආදරේ කරන්න. ගරු කරන්න. දෙවි පියාණන්ට ස්තුතිකියන්න. ලැබෙන දේවල්වලටත් නොලැබෙන දේවල්වලටත් මේ නත්තලේදී. ජේසු බිළිඳුන්ගේ ආදරයෙන් පිරිල ජිවිතය ලස්සන කරගන්න. ඔබ සැමට සුබම සුබ නත්තලක්.



**ටෙක්ලා කල්දේරා නැන්දා,**

**ඇඳුම් පැළඳුම් වලින් නත්තලේ දී සැරසෙද්දී ඔබේ අසල්වැසි පවුලක දරුවෙක් හෝ දැරියක නිසි ඇඳුමක් නැති කමින් නත්තල් දින දිව්‍ය පූජාවන්ට සහභාගී නොවනවා විය හැකිය. ඔබේ දෙමාපියන් ගේ අවධානය එවන් දෙයකට යොමු කළහොත් ඔවුන් ඒ ගැන යම් පියවරක් ගතහොත් ඔබට කොතරම් ප්‍රීතියක් භුක්ති විඳිය හැකිද? ඔබද මෙද නත්තල වඩාත් අර්ථවත්ව ගත කරන්නට මෙම සිතිවිලි ක්‍රියාවට නංවන්න හිතට ගන්න.**

**සී. ආර් ඩික්සන් ඇන්ටනි මාමා**

උඳුවප් මහේ මෙලොව
එළිය දකිමින්
ආදරයේ අරුත ලෝ දනන්
හට පෙන්වූයේ ඔබගේ
නොනිමෙන ප්‍රේමය නිසාවෙනි.......
දුප්පතුන්ගේ අඳෝනාවට
නිති පිළිසරණයක් වෙමින්,
දුකින් පෙළෙන්නන් සනසවන්නට
මිනිසත් බව ගෙන මෙලොව
ඉපදී, මිනිසුන් අතර
වැඩ වසනා ජේසු කුමරාණෙනි,........
නත්තලේ අරුත නුඹයි
දැනුණා නුඹේ
සාමය සහජීවනය වපුරන
නිමක් නොමැති
දයා කරුණාව .......

**සිකිලා ජයාංගනී ජයකොඩි**
13 ශ්‍රේණිය
දංකොටුව බාලිකා මහා විදුහල





සාමය පැතිරෙන සිහිල් සුළංරැල්
පවන් සල සලා දසත ඇදෙන්නේ
හදේ නැගෙන්නේ රැව් පිළි දෙන්නේ
සාමයෙ පැතුමයි රළ පෙළ වාගේ

දිළිඳු ගවලෙනක් තෝරා ගත්තේ
මිනිස් පව් බර වැඩි හින්දාදෝ
කියන්න දෙව් කුමරුනි මිනිස් පුතෙක් උනේ
අප ගලවා සුරපුර ගෙනියන්නද

**නිමේෂා මධුමාලි සමරකෝන්**
13 ශ්‍රේණිය (කලා අංශය)
ශා. අන්තෝනි මහා විද්‍යාලයය - අලගොල්ලෑව

# කිතු උපතේ අසිරිය



නත්තල් කාලේ ආවා
ගේ දොර අස්පස් කෙරුවා
නත්තල් ගහ සැරසෙව්වා
පුංචි ගවලෙනක් හැදුවා

කිතුනු සැවොම එක් වෙලා
සාමයෙ සුව විඳිනටා
දෙවිඳු යදිමු නත්තලේ
අරුතත් එක් කරමිනා

**මනෝෂා දිල්මිණී**
06 ශ්‍රේණිය
දිව්‍ය හෘදයේ දහම් පාසල
හෙට්ටිපොල

**බලා හිඳිමි මා**
**නෙතුපිය දල්වා**
**මනු බව ගෙන පැමිණෙන**
**තුරු මාගේ ලොවට.........**
**පුංචි ගවමඩුවක ඉපිද**
**මව් තුරුලේ නැළ වී හිඳ**
**ලෝ දනන් පව් බරින්**
**මුදා ලන්නට**
**මනු බව ගත් කුමරුනී .......**
**පව් බරින් පිරි මාගේ හදට**
**ආදරයේ සොඳුරු වදනක්**
**පවසන තුරු......**
**නත්තලේ අසිරිය ලොවට**
**කියාපාන මේ උතුම් රැයේ**
**ඔබේ සුරත ගෙන ඇවිද**
**යන්නම් බොහෝ දුර**
**අප වෙනුවෙන් පිදූ**
**ඔබගේ ඒ සෙනෙහස**
**අමිල වූ සුරලොවකි.......**

**තිවංකි තාරුණ්‍යා ප්‍රනාන්දු**
09 ශ්‍රේණිය
ශු. බෘනෝ මුනිඳු
දහම් පාසල - තඹකන්ද



ජුසේ තුමා මරිය තුමිය
සමග වඩින්නේ
බෙත්ලෙහෙමේ සංඝණනය
නිසයි වඩින්නේ
මරිමව් කුස ජේසු බබා
සුවයෙන් ඉන්නේ
ජේසු බබා ගවලෙන
තුළ ඉපිද සිටින්නේ



**ශ්‍රියාන් මධුෂ තිසේරා**
08 ශ්‍රේණිය
ලූර්දු මාතා දහම් පාසල - නාත්තන්ඩිය

කෙටි කතාව

# නත්තල් සීයා



ඉමාෂියි - නිමාෂියි නිවුන් සහෝදරියෝ මේ දෙන්නම ඉන්නේ කන්‍යාරාමයක ඇයිද දන්නවාද? ඒ දෙන්නාගෙ අම්මයි තාත්තයි මෙලොව හැරගිහිල්ලා නිසා. ඒ ක වුනෙත් දවසක් අම්මයි තාත්තයි ගමනක් ගොහින් ගෙදර එන අවස්ථාවේ ගඟට ඉහලින් ඇති පාලම උඩින් එන කොට පය ලෙස්සලා මෙයාලගේ අම්මා ගඟට වැටුණා. ඒ එක්කම මෙයාලගේ තාත්තා ගඟට පැන්න අම්මව බේරගන්න ඒත් අවාසනාවක මහත අම්මා මරු විකලෙන් තාත්තාව බදගත්ත නිසා අම්මයි, තාත්තයි සදහටම නොඑන ගමන් ගියේ ඒ ආකාරයටයි.

සෑම දිනකම දෙවි මැඳුරට එන මේ යුවලට මෙහෙම වුනේ ඇයි කියලා කව්රුත් අදත් කථා වෙනවා. නමුත් හයක් හතරක් නොදන්න මේ අක්කා, නගෝ පැවිදිසොයුරියන් සමඟ කන්‍යාරාමයක කල් ගෙවනවා. ආධ්‍යාත්මික ගරු පැවිදි සොයුරියක් මේ දෙන්නාගේ වගකීම භාර ගත්තේ ඒ වෙනුවෙන් කව්රුත් ඉදිරිපත් නොවුනු නිසයි. මෙයාලාත් එක්ක තවත් දරුවෝ මේ කන්‍යාරාමයේ ඉන්නවා. නමුත් එක්කො තාත්තා නැහැ. එක්කො අම්මා නැහැ. එහෙම නැතහොත් කව්රුත් උදව් නොකරන නිසා කියලා මට හිතුනා කොහොම, කොහොම හරි නත්තලත් උදා වුනා. දැන් පැවිදි සොයුරියෝ මේ ඔක්කෝටම කියලා තිබ්බේ රෑ 12න් පස්සේ නත්තල් සීයා ඇවිත් තමන්ගෙ කොට්ටෙ ලඟින් තෑගි තියලා යනවා කියලයි. කන්‍යාරාමය ලගම තමයි දේවස්ථානය තිබුනෙත්. හරියටම දෙසැ. 24 වනදා රාත්‍රි 12 හේ කණිසම වැදුනා ඉමාෂි වේල පහින්ම හිතා ගත්තා ''අනේ නත්තල් සීයාව දකින්න ඇත්නම් ''කියලා සිස්ටර්ලා කොටසක් පල්ලියට ගියා කොටසක් දණ ගහලා කන්‍යාරාමයේම යාච්ඤා කළා. පොඩි බට්ටියෝ ටික ගොරව, ගොරවා නිදි. නත්තල් ගහේ ලයිට් එලියට ඒ අයගේ මුහුණු දකිනවා. මේ අතර ඉමාෂිගේ ආශාව ඉෂ්ට කරගන්න අදහසින් ඇය නොනිදා පහන් කිරීමට තීරණය කළා.

පාන්දර එකට විතර පල්ලි ගිය සිස්ටර්ලා කන්‍යාරාමයට ඇවිල්ලා කේක් කාලා කෝපි බිබී කථාව, සමහරු බදගෙන සුභ පතනවා. මේ අතරේ කළුවරේ ඉමාෂිලාගේ කාමරේ දොර ඇරුණා කව්දෝ කෙනෙක් ආවා කියලා ඉමාෂිට දැනුණා. එයා හිටපු තැනම තමා ''ස්විච්'' එක තිබුනෙත්. ආපුකෙනා හැම ඇඳක් ලඟටම යන බව දැණුනා. කොහොම වුනත් ඉමාෂිගේ කොට්ටෙ ලඟ සිරි, සිරි හඬ මැදින් යමක් තිබ්බ වගේ ශබ්දෙට ඉමාෂි වහාම ක්‍රියාත්මක වුනා ''ස්විච්ය'' තදකළා විදුලි බුබුල දැල්වුනා.

බැලින්නම් නත්තල් සීයා තෑගි දෙන්න ඇවිත්, පූජාවට උදව් වෙන ලොකු ළමයෙකුගේ ලෝගුවක් ඇඳ ගත්තු කෙනෙක් කොහොම වුනත් මුහුණ වහගෙනයි හිටියේ. ඒත් දල හිටපු සෙරෙප්පු වක් අතරින් එක් ඇඟිල්ලක් කොට එක්කෙනෙක් බව ඉමාෂිට තේරුම් ගියා. නත්තල් සීයා තෑගී තියලා පැනලා ගියා. ඉමාෂි කල්පනා කළා ඇඟිල්ලක් කොටට ඉන්නේ සිස්ටර් ජුලියට් නේද? කියලා පසුවදා බට්ටියෝ ටික නැඟිටලා බලනකොට ඔක්කොටම නත්තල් සීයා තෑගි දීලා ගිහිල්ලා හරිම සතුටුයි. ඒත් ඉමාෂි වැඩේ දැනගත්තා සිස්ටර් ජුලියට්ගේ යාළුවා සිස්ටර්ජේසි ඇවිත් ඉමාෂි ගෙන් ඇහුවා ''නත්තල් සීයා රෑ දැක්කද? '' කියලා. එයා ගත් කටට කිව්වා

''නත්තල් සීයා නෙවි ඊයේ රෑ නත්තල් ආව්ච් කෙනෙක් නම් ආවා '' කියලා. ඒ කොහොමද කියලා සිස්ටර් ඩේසි ඇහැව්වම ඉමාෂි කිව්වේ.''ඇයි සිස්ටර් කකුලේ ඇඟිල්ලක් කොටට තියෙන්නේ සිස්ටර් ජුලියට්ගේ විතරයි නේ '' කියලා

කොහොම , කොහොම හරි සිස්ටර් ඩේසි කිව්වේ කාටවත්ම මේක කියන්න එපා කියලයි. අදටත් ඒ කථාව දන්නේ ඉමාෂියි, සිස්ටර් ඩේසියි , සිස්ටර් ජුලියටුයි විතරයි.

**ජුඩ්.ජේ. ප්‍රනාන්දු මාමා**

## මාසික සිතිවිල්ල



මාසික සිතිවිල්ල

"දෙසැම්බර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

**සේයා**
**ටෝනි නිශාන්ත ප්‍රනාන්දු**

# ළමා ඔබට සිතිවිල්ලක්...

ජේසු උපත තුළින් අප දරුවන්ට ලබාගත හැකි ආදර්ශයන් රැසක්. පුංචි දිවියේ අප පුංචි ළමයි ඉපදුන විට අම්මා, තාත්තාට කොතරම් සතුටක් ඇත්ද? ආදරය, සෙනෙහස , දයාව මුසුව බැඳීමකින් ඒ උත්තරීතර සතුට ලබාගන්න සමත් වන දෙමාපියෝ තම දරුවන්ගේ අනාගත සැලසුම් එදා සිටම පිළියෙළ කිරීමට අදිෂ්ඨාන කරගනියි.

මරිය තුමිය වෙත උන්වහන්සේ කන්‍යාවියක ලෙස මහ බලපරාක්‍රමයෙන් ලොව විස්මිත කළ දරු උපත තුළින් විදහාපන සාමයේ සංහිඳියාව වෙනත් දරු උපතකට වඩා බෙහෙවින්ම වෙනස්විය. ජීවිතය ජයගන්නට නම් ළමා අපගේ සිත් සතන් ජේසුස් වහන්සේගේ ජීවිතය දෙස යොමු කිරීමද විශේෂ යෙන් වැදගත් වෙයි. නත්තල ගත කරන අප ළමුන්ගේ විශේෂ අවධානය යොමු කළයුත්තේ සාමයෙන්, සතුටින්, සහෝදරත්වයෙන්, ජීවත්වීමටය. ජේසු කුමරු තම දෙමාපියන්ගේ අණට කීකරුව ජීවත්වුවාසේම, ඒ ආදර්ශය අපද සිත්තුළට ගෙන යහපත්ව ආදර්ශමත්ව ක්‍රියා කිරීම අපගේ හදවත්තුළට රෝපණය කර ගත යුතු විශේෂ කාරණයකි.

නත්තල සාමයේ සංකේතයයි. මේ දිනය ගත කරන ළමුන් දෙව්මැදුරේ දිව්‍ය පූජාවට යාම, දිව්‍ය සත්ප්‍රසාදය ලැබීම දෙමාපිය සහෝදර සහෝදරියන් සමග එකමුතුව, සාමයෙන් සතුටින් ගත කිරීම නත්තලේ සිදුවිය යුතු විශේෂ කරුණකි. නත්තල ජේසු ගෙනා සාමය තුළ අසල්වැසි ප්‍රේමය, දයාව අසරණයන්ට සරණය වීම. නැතිබැරි අයට උදව් කිරීම වැනි උතුම් ගුණාංග තුළ ජීවිතය ආදර්ශමත්ව ගත කිරීම කාලෝචිතය.

**මැක්සිමස් රෝයි පෙරේරා මාමා**

# නත්තල

| | |
|---|---|
| නත්තල දැන් දැන් ලං | වෙනවා |
| ලොව දසතින් සිසිල් සුළං | නැළවෙනවා |
| සාමයේ හඬ දසතින් පිලිරැව් | දෙනවා |
| මරිය කුසේ දෙව් බිළිඳා | සැතපෙනවා |
| ගොපලුන්ගේ සුසිර ගීත දසත | ඇසේ |
| ජුසේ පියා ජේසු කුමරු පසෙක | දිසේ |
| දෙව්දූතුන් මහිම ගීත නගන | ලෙසේ |
| ගව ඔරුවේ ජේසු කුමරු නිදනු | දිසේ |
| බිළිඳු පුදට පඬුරු රැගෙන | පැමිණෙනවා |
| සිසිල් රැයේ දෙව් මහිමය | පැවසෙනවා |
| වල්ගා තරුව මඟ එළිකර | බබළනවා |
| ගවහලේ බිහිවු සමිඳු නත්තල ගෙන | එනවා |

**එම්.ඩී. සුරංගි නෙළුමා** (ආචාර්ය මඩුල්ල)
සාන්ත පීතර විදුහල

**විශේෂ දැනුම් දීමයි...**

**ආදර දුවේ, පුතේ, නත්තල නිමිත්තෙන් කොළඹ කතෝලික මුද්‍රණාලය වසා තිබෙන බැවින් ලබන සතියේ (දෙසැම්බර් 30) ළමා ප්‍රදීපය පල නොවේ. නැවතත් සුපුරුදු පරිදි 2014 ජනවාරි 06 වන සඳුදා සිට ළමා ප්‍රදීපය පළ කෙරේ.**

**සංස්කාරක පියතුමා**



# නත්තලේ සතුට

සැම නිවසෙම නත්තල් ගී රාව ඇසෙනවා
ගවලෙන් වල වල්ග තරුවෙ එළිය පෙනෙනවා
පුංචි ළමයි ගීත හඬට නැටුම් නටනවා
ජේසු බබා දොරකඩ හිඳ බලා සිටිනවා

**මේරියන් සසිනි පබෝධා**
06 ශ්‍රේණිය
දංකොටුව බාලිකා විදුහල

**ජුසේ මුනි සමඟිනා**
**මරිමවුන් දුක් විඳිමිනා**
**එහෙත් සතුටු සිනා**
**තව ටිකයි ජේසු ඉපදෙනා**

**බැටලුවන් සතුටින් ඉපිලෙනා**
**රජවරු පඬුරු පුදමිනා**
**කවුද මේ ඉපදුනේ බෙත්ලෙහෙමිනා**
**විමුක්තියේ රජු ගවහලේ ඉපදුනා**

**ශාවින්දි ශෂිකලා**
06 ශ්‍රේණිය
ලූර්දු මාතා දහම් පාසල
නාත්තන්ඩිය



# අසිරිමත් උපත



සීත සුළං දසත හමන්නේ
ගීතිකා රාවයන් අවට ඇසෙන්නේ
තුරුලිය මල්ගොමු සුවඳ හමන්නේ
සමිඳු වඩිනා බව ලොවට කියන්නේ

ලෝ පව් දුරලන අජ බාලකයාණෝ
සාමය ගෙන එන කුමාරයාණෝ
මරණය ජයගත් දෙව් සමිඳාණෝ
නත්තල ගෙන එන දෙව් බිලිඳාණෝ

පාප අඳුර ලෝතලයෙන් පහවෙන්න
දුක් දොම්නස අප අතරින් දුරුවෙන්න
සොහොයුරු පෙම සැම හද තුළ රජවෙන්න
ජේසු බිළිඳේ මේ නත්තල සරසන්න

**අනුෂා වාස් - දළුවකොටුව**

# "විවර කරනු මැනවි අප හදවත් සාමයේ කුමරුනේ"

කිතු සමිඳුන් පිළිගන්නට අලංකාරව ලොව සූදානම් වනවා සේම මුළු කිතුනු ජනතාවද ලහිලහියේ තම නිවෙස් පවිත්‍ර කර වතු පිටි අලංකාර කර ගනිති. එපමණක් නොව කෘතිම ගවලෙන් සාදමින් කිතු සමිඳුන් පිළිගැනීමට සැරසෙති. විවිධ දේ ආලේප කිරීම්, ගවලෙන වැනි දේ බාහිර දේවල්ය. නමුත් අපගේ හදවත නැමති ගවලෙනට කිතු සමිඳුන්ට පැමිණෙන්නටවත්, මංශගතවන්නටවත් ඉඩක් නොමැත.



මක්නිසාද අපගේ හදවත තුළ වෛරය, ඊර්ෂ්‍යාව, පලිගැනීම , තන්හාව, ක්‍රෝධය , අසල් වැසියා හට අනවින කිරීම් හා ඔවුහු සමඟ ආරවුල් තිබේ නම් සැබෑ නත්තලේ ප්‍රේමයේ සාමය අපි කෙ-සේ සමරම් ද? මෙකී දුර්ගුණයන්ගෙන් අපගේ හදවත පිරී ඉතිරී ගොසින්ය. නිරතුරු අප රෝගිවන්නේ ද අපගේ හදවත තුළ මෙවැනි දුෂ්ට කම් කැකෑරි තිබෙන නිසාය. එසේ නම් මෙම ලෞකික දුබලකමේ ගවලෙන නැමති අපගේ හදවත ඉවත දමා නව ගවලෙනක් අපගේ හදවත තුළ තනමු.

අඳුර බිඳලා ආලෝකය රැගෙන අපගේ හදවත් තුළට වැඩම කරන්නටත් නිවී යමින් තිබෙන කතෝලික විශ්වාසය / වටිනාකම නැමති දහම් සිළුව දල්වන්නටත්, බාහිර ආටෝපයට වඩා ආධ්‍යාත්මිකව සූදානම් වෙමින් අපගේ හදවත තුළ ඇති කිලිටි සෝදා පවිත්‍ර කර, අපගේ හදවත් තුළ නව පිබිදීමක් ඇති කර අන් අයගේ දුක වේදනාව අපගේ කරගෙන කිතු උපත දිනයේදී අපගේ ජීවිත නැවුම් උපතකට ගෙන යන්නටත්,

අපගේ දුබලකම් පිළිගෙන මනස්ථාප වී සාමයේ කුමරුවන් අපගේ හදවත් තුළට පිළිගන්නට අපි දොරටු විවෘත කරමු. සැබෑ ජීවිත පෙරළියකට සූදානම් වෙමු. කිතු සමිඳුන් ලොවට ගෙනා සාමයේ ප්‍රේමයේ පණිවුඩය අප තුළින් අන් අයට අත්දකින්නට අවැසි වරම් ජේසු බිළිඳුන් ගෙන් ඉල්ලා යදිමු. ඔබ සැමට සාමය, සතුට පිරී සුබ නත්තලක් වේවා.

**යසිත සුපුන් පෙරේරා**
සා. ජෝශප් දෙව්සත්හල
පූර්ණවත්ත , මහනුවර

# වල්ගා තරුව

උදුවප් මාස යේ
සීතල මැදියම් රැයේ
අමුතු තරුවක් පෑවුයේ
එය වල්ගා තරුවක් වූයේ



**පියුමි කෝකිලා මධුෂාණි**
07 ශ්‍රේණිය
ශා. හෙලේනා දහම් පාසල
හිරිපොකුණ

# ලොව රටින් රට නත



චීනය



දකුණු අප්‍රිකාවේ



රුසියා

ලොව විවිධ
රටවලට අද
අන්දම මෙහි අ
ශ්‍රී ලංකා



ඉතියෝපියාව



ආර්ජන්ටිනාවේ නත්තල



කොස්ටරිකාව



ඉක්වදෝරය



බෙලරුසියාව

# ත්තලේ අසිරිය දිස්වන අයුරු






ව



කෙන්යාව



යුරෝපයේ මරිය තුමියගේ නත්තල



යුරෝපයේ ජුසේ තුමාගේ නත්තල

රටවල නත්තල මූර්තිමත් කිරීමේදී ඒ ඒ
ළ සංස්කෘතික ලක්‍ෂණ උද්දීපනය කරන
ඇති සිතුවම් වලින් කදිමට නිරූපණයවේ.
වේ අප ඊට කොයිතරම් සංවේදීද?



කසකස්තානය





ස්ලෝවැකියාව



චෙක් ජනරජය



කැනඩාව

ශිරාන් මෛත්‍රී

අසිරිමත් නත්තල අර්ථවත් කර ගැනීමට අපට බොහෝ දේ කළ හැකිය. සාද පවත්වනවාට වඩා එම මුදලින් කෑමට, බීමට, නැති අපේම ජනතාවට ආහාර පාන ලබා දීම, උදෑසන හෝ රාත්‍රියේ පූජාවට සහභාගි වීම, හිත් අමනාපයෙන් සිටින්නන් සමග සතුටු සාමිචියේ එකමුතුවෙන් දවස ගත කිරීම වැනි දෑ අපට කළ හැකිය. මෙවැනි හොඳ ගුණාංග අප තුළ වැඩි වර්ධනය කර ගනිමින් අසිරිමත් නත්තල ඉතාමත් අසිරිමත් මෙන්ම අර්ථවත් කර ගැනීමට අපට හැකි වේ. සාම කුමරුගේ උපත දුප්පත් පොහොසත් සියලු දෙනාට පොදු දෙයක් වන බැවින් දුප්පත් ජනතාවට අත්වැලක් වීම කිතුනු අපගේ වගකීමයි. කිතුනුවෙක් වන ඔබ මෙම අසිරිමත් නත්තලේදී ඔබ සමග සිටින දුප්පත් යහළුවකුට ඔබට ලැබෙන දේ බෙදා හදා දෙමින් සාම කුමරුගේ උත්පත්තිය සතුටෙන් ගත කිරීමට සිතට ගත යුතුය. මෙවැනි හොඳ ගුණාංග ආදි කාලයේ ජනතාව අකුරටම ඉටුකර තිබුණත් අද සමාජයේ ජනතාව මේවා පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වයි. ඇතැම් විට දුප්පත් පොහොසත් ජනතාව අප රටේ කෙතරම් ජීවත් වුවත් පොහොසත් ජනතාවට වඩා තම ආගම කෙරෙහි ගරු බියක් දක්වන්නේ දුප්පත් ජනතාවයි. මේ නත්තල් සමයේ කිසිදු භේදයකින් තොරව මේ අසිරිමත් නත්තල සැමරිය යුතුය. අර්ථවත් නත්තල අප සැමරිය යුත්තේ ප්‍රීතියෙන්, සාමයෙන් හා එකමුතුවෙන්ය. නත්තල අපගේ ගැළවුම් කරුවාණන්ගේ උත්පත්තිය නිසා එතුමාට අප ගෞරවය, නමස්කාරය පුද කළ යුතුවෙමු. නත්තල අසිරිමත්ව නොව අර්ථවත්ව සමරමු. සියලු දෙනා සමග එකමුතු වී අත්වැල් බැඳගනිමු

**ඩිමාෂි ප්‍රනාන්දු**
07 ශ්‍රේණිය
නිර්මල හෘදයේ දේවමාතා දහම් පාසල - බණ්ඩිගොඩ



**ටි. හස්මින්දි විජේසූරිය** - සා. මරියා සිද්ධස්ථානය - මාතර



**ඔනෙත් දම්රු**
03 ශ්‍රේණිය - සා. පිතර විදුහල - ගම්පහ



**දිනෙක් සුපේශල හෙට්ටිආරච්චි**
01 ශ්‍රේණිය
ආශ්චර්ය යුක්තවූ දේවමාතා දහම් පාසල - හපුගොඩ



**තරුෂි ඉමායා මතුගම**
06 ශ්‍රේණිය
නිර්ම හෘදයේ දේවමතා දහම් පාසල - බණ්ඩිගොඩ



**තිසුම් ශාලුක**
03 ශ්‍රේණිය
ශු. මතෙව් දහම් පාසල
ඒකල - කොටුගොඩ මීසම

**නත්තලට සමගාමීව බටගම මීසමට අයත් බණ්ඩිගොඩ නිර්මල හෘදයේ දේවමාතා තරුණ සමිතිය මගින් දහම් ළමුන්ට පැවැත්වූ චිත්‍ර සහ රචනා තරගයේ ප්‍රථම ස්ථාන දිනාගත් නිර්මාණයන්.**

# නත්තලේ සැබෑ අරුත

ජේසු කුමරු මෙලොවට වැඩියේ නැතිවී ගිය දේව දරුකම නැවත මිනිසාට අත්කර දීමේ මූලික අදිටන පෙරදැරිකරගෙනයි. අපි සැවොම අසිරිමත් නත්තලකට සූදනම් වෙනවා. ආහාර පාන, ඇඳුම් පැළඳුම් , සැරසිලි මිලදී ගනිමින්ද ගේදොර කළ එළි කරමින් ළඟ එන නත්තලට සූදනම් වෙනවා. මේ සූදනම වර්තමාන සමාජයට අනුව අපිත් හැඩගැසී ඇත්තෙමු. ඒත් මේ කිසිදෙයක් නැති අය කොච්චර ඉන්නවාද කියලා ඔබ කල්පනා කරන්න නැතිව ඇති. යුද්ධ , ස්වභාවික විපත් ලෙඩ රෝග හා විවිධ අගහිඟකම් නිසා නත්තල සමරන්න බැරි කොපමණ පිරිස් ඉන්නවාද , ඇඳුම් ගන්න නොව ඉන්න තැනක් නොමැති අය , අම්මලා තාත්තලා නැති දරුවන් , දරුවන් නැති අම්මලා තාත්තලා කොච්චර ද, නත්තල අපි ප්‍රීතියෙන් සමරද්දි ඒ අය දුක්වෙනවා නේද?

උන්වහන්සේගේ ප්‍රේමයේ හා සාමයේ පණිවිඩය ලෝකයේ සෑම දෙනකුටම පොදු බව අමතක කරන්න එපා. ඒත් ජේසු ගෙන ආ සාමයේ හා ප්‍රේමයේ පණිවිඩය ක්‍රමයෙන් ඈත් වී පාපය, දුක, වෛරය, සෑම තැනම වෙලා ගෙන.

ඒ වුණත් ජේසුගේ දරුවන් වන අපට පුළුවන් ජේසුගේ ප්‍රේමය අන්අයට බෙදන්නට. නත්තලේ විවිධාකාර දේවලට වියදම් කරන මුදලින් දිළිඳු පවුලකට , නැතිනම් කන්න නැති අයෙකුට කෑම වේලක් දෙමාපියන් සමඟ දිය හැකිද? එසේ කළහොත් දිළිඳු පවුල, දුගියා පමණක් නොව ජේසුත් සතුටු වෙනවා.

*ඔබට සුභ නත්තලක් වේවා !......*

**වියානි පියුමන්ත පෙරේරා**
දළුගම



**බිනෙත් සාමක**
05 ශ්‍රේණිය
සා. පීතර විදුහල
ගම්පහ

# නත්තල හා සාමය

නත්තල යනු ජේසු බිළිඳුගේ උපත සමරන දිනයයි මෙහි සැබෑ අරුත සාමයයි. පුංචි අපිද සාමකාමී ලෙස අප නිවසේ පාසලේ හැසිරීමට පුරුදු වෙමු. නත්තල් දිනයේදී ගවලෙනක් සාදා දිළිඳු අයට උදව් කොට නත්තල් දිව්‍ය මෙහෙයට සහභාගි වී නත්තල සමරමු.

**ශෙනායා ප්‍රනාන්දු**
04 ශ්‍රේණිය - ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය - බම්බලපිටිය

# වඩිනු මැනවි

**අඳුරින් බර සිත් - කඳුලින් පිරි නෙත්**
**තනිවී , කොන්වී - අතරමං වූ මේ සැම සිත්**
**සතුටින් එළියෙන් - පුරවාලන්නට**
**අප ගැලවීමටම උපන් ජේසු කුමරුනේ..........**
**ඔබ වඩිනා තුරු - මඟ බලමින් අපි ඉන්නේ**

**හිමාජ් තරූෂ පෙරේරා** - 07 ශ්‍රේණිය
ශු. රෝගුස් මුනි දහම් පාසල - ඇලතුර

# පුංචි මගේ නත්තල

ගව මඩුවක් හැදුවා
පිදුරු ටිකක් දැම්මා
ජේසු බිළිඳු තැබුවා
නත්තල යැයි කීවා
අප ගෙදරත් නත්තල්
අප ගමටම නත්තල්
මුළු ලොවටම නත්තල්
සැමටම සුබ නත්තලක් වේවා !

**රෝෂිත් වත්සාන පෙරේරා**
03 ශ්‍රේණිය
ගොන්සාල්වේස් විදුහල
පමුණුගම



**නුෂෙල් වල්පිට**
04 ශ්‍රේණිය
සා. බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07



**ලෂිනි ජෙනාරා**
07 ශ්‍රේණිය
දංකොටුව
බාලිකා මහා
විදුහල

**මේරියන් ශාවින්දි**
03 ශ්‍රේණිය
සිරිකුරුස
විදුහල
ගම්පහ



**අයේෂා මධුෂානි**
08 ශ්‍රේණිය
ශු. ආනා දහම් පාසල
පුවක්පිටිය





**රසිදු නෙත්කැලුම්**
07 ශ්‍රේණිය
මාරිස්ටෙලා විදුහල - මීගමුව

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව",
ළමා ප්‍රදීපය,
අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය
මාවත, කොළඹ
08.





**දමිතු තුසාන්**
04 ශ්‍රේණිය
සා. මරියා
ධර්මදූත
ළමා සමාජය
සීදුව



**රුසිත් හිරුෂ ප්‍රනාන්දු**
03 ශ්‍රේණිය
කුඩාමඩු
දහම් පාසල
උඩයන්දළුව
(කන්ජුක්කුලිය
මීසම)

# අසිරිමත් නත්තල



නත්තල් ගස පාමුල
ඇති තෑගි ගොඩ දකිනවිට
සිහිවන්නේ මට
නත්තල නැති අසරණයන්වය
එහෙත් එය මාගේ වරදක් නොවේ....
මේ මාගේ ලැබීමය.....
ඒ ඔවුන්ගේ ලැබීමය......
එනමුත් එය පදනම් කොටගෙන
නිකම් සිටීම කිතුනුකම නොවේ
පන්ති පරතරය හැරදා....
පිහිට වෙමු ඒ අසරණයන්ට
සුභ නත්තලක් ලැබෙන්නටනම්



**එවාන් ප්‍රනාන්දු**
09 ශ්‍රේණිය
ලූර්දු මාතා දහම් පාසල - කිඹුලාපිටිය

ලෝකයට ආලෝකය දීමට සපැමිණි
රාජාති රජිඳුන්ගේ
ජන්ම දිනය අපි සමරමින්
ඒ වෙනුවෙන් අපි කැපවෙමු දැන්
අප තුළ ඇති පව් දුරලමින්
නත්තල් ප්‍රීතිය, විඳගමු අප සැම
දේව ජනතාවක් ලෙසින්
එලෙසම අප සැම
දෙව් බිලිඳුන් ලෙසින් දිළිඳුනට පිහිටක්
වෙමින්
නත්තල සමරමු නව අරුතක් දෙමින්

**සම්පත් නෙතුපුල් ලංකා**
10 ශ්‍රේණිය
සිරි කුරුස දහම් පාසල - තරාල



ජේසු කුමරු ලොව ගලවා ගැනීමට
පැමිණෙන්නේ මිනිසුන් තිරිසන්
ලෙස පාප මාර්ගයන්ට යොමුවන්නේ
ඔවුන්ගේ පාප ක්‍රියා නිසා
ජේසු කුමරුව අමතක කරලන්නේ
ජේසුස් වහන්සේ අපට සමාව දී
සැමටම සෙනෙහස දක්වන්නේ

**ඈන් විනෝලි මධුෂාණි**
12 ශ්‍රේණිය (කලා අංශය)
ගොන්සාල්වෙස් මහ විදුහල - පමුණුගම

ගවහලක ගනඳුරක සීතලේ ඉපදිලා
ගුළිවෙමින් මව් ලයට බිලිඳු පුතු හිනහිලා
ලෝ දනා ගලවන ලෙසින් මේ ලොවට බිහිවීලා
මව් ලයේ දෙව් පුතු නිදයි සීතලේ ගුලිවීලා

ආදරය ලොව හට කියා දුන් දෙව්පුතා අද ඉපදිලා
පවින් අපගේ සිත් මුදන්නට ජේසු සමිඳුන් පැමිණිලා
ගවහලක ගනඳුරක ගව ඔරුව මත සීතලේ සැතපිලා
සිත්සතන් සුවපත් කරන්නට සාමයේ කුමරු ඉපදිලා

**හිරුණි රංසිකා**
10 ශ්‍රේණිය
ශු. ඉසිදෝරු දහම් පාසල - තිබ්බොටුගොඩ

**සාමයේ කුමාරයාණෙනී**
**සාමයේ පණිවිඩය ලොවට දෙමින්**
**ජේසුගේ උපත අප සමරනවාසේම**
**නැති බැරි කෙනෙකුට**
**ත්‍යාගයක් පිරිනමමින්**
**සාමයේ කුමරුන් සිහි**
**කරනවානම් එයයි**
**අපගේ නත්තල ,**
**එයයි අපගේ සතුට**



**ෂෙනෝන් කාවින්ද පෙරේරා**
10 ශ්‍රේණිය
ශා. රෝගුස් දහම් පාසල - ඇලතුර



**පෙර පාසල් විවිධ ප්‍රසංග**



මොරටුව ඉඩම පාතිමා අප ස්වාමි දූගේ පෙර පාසලේ වාර්ෂිකව පවත්වන විවිධ ප්‍රසංගය කොළඹ අගරදගුරු පදවියේ කතෝලික පෞද්ගලික පාසල් සාමාන්‍යාධිකාරී ගරු රන්ජිත් මදුරාවල පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් ශාන්ත සෙබස්තියන් දෙව්මැදුරේ දහම් පාසල් ශාලාවේදී පැවත්වුණි. මෙදින අවස්ථාවක් සේයා රුවෙහි දිස්වේ.

**රන්ජිත් කුරේ**

---

නාත්තන්ඩිය සා. ජෝශප් පෙර පාසලේ නත්තල් විවිධ ප්‍රසංගය දිව්‍ය සංරක්ෂණයේ දියණියෝ නිකායේ ප්‍රාදේශාධිපතිනි ගරු මර්ලින් ප්‍රනාන්දු පැවිදි සොයුරියගේ ප්‍රධානත්වයෙන් හා ගරු පැවිදි සොයුරිය හා ගරු පියතුමන්ලාගේ සහභාගිත්වයෙන් පැවැත්වුණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**ශ්‍රීයාංගණී පිලීෂියා.**



---



# ගවලෙන් තරඟයෙන් බලගලට ප්‍රථම ස්ථානය

සදහම් සජීවක මෙහෙවර විසින් පවත්වන ලද කොළඹ අගරදගුරු පදවි ගවලෙන් තරඟයේ 16න් පහළ ප්‍රථම ස්ථානය ලබා ගැනීමට බලගල පූජා උදවි දරුවන් සමත් වූ අතර ඒ වෙනුවෙන් රුපියල් ලක්ෂයක මුදලක් දිනා ගන්නා ලදි. ත්‍යාග ලබාගත් බලගල පූජා උදවි දරුවන්, විශ්‍රාමික අගරදගුරු අති උතුම් නික්ලස් මාකස් හිමි, විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමි, ගරු සිසිල් ජෝයි පියතුමන් සහ මීසම් සේවක ගරු ජූඩ් රාජ් පියතුමන් ජායාරූපයෙහි දැක්වේ.

**තිළිණ අලහකෝන්**

## තල්ගහපිටිය සා. සේවියර් විදුහලේ නත්තල් උත්සවය

කුලි/ තල්ගහපිටිය සා. සේවියර් කණිටු විදුහලේ නත්තල් උත්සවය තල්ගහපිටිය මීසම් සේවක ගරු ඇන්ඩෲ පොන්සේකා පූජාප්‍රසාදීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. විදුහලේ ක්‍රිස්තු ධර්මය විෂය භාර චමිලා පීරිස් මහත්මිය, ගරු. විදුහල්පති ඇතුලු ආචාර්ය මණ්ඩලය එක්ව මෙය සංවිධානය කළහ.

**කේ.ඩී. පයස්**




බයිබලය ඇසුරෙනි
33
චිත්‍රකථා රචනය අනන්ද කල්දේරා
දෙබස් හා චිත්‍ර:- ඇස්.ඒ.පී. සමරආරච්චි
ආරොන් සිය ලී දණ්ඩ බිමට පතිත කළ විට එය වහා සර්පයකු බවට පත්විය..
අද්බුතද ?
ලී දණ්ඩ සර්පයකු බවට පත්වුනා...
ඔය වැනි දේවල් විජ්ජාවල්.. ඕවා මගේ විජ්ජාකාරයින්ටත් කළ හැකියි.. සෙබළු.. මගේ විජ්ජාකරුවන්ට එන්න කියනු..
ඉන් පසු පාරාවෝගේ විජ්ජාකරුවන්ද.. ලී කැබලි බිමට දමා ඒවා සර්පයින් බවට පත් කළෝය...
දැක්කද..? නුඹලාගේ දෙවියන්ගේ බලයක් නැහැ.. ඕව ඔක්කෝම ..මායාවල්..
ඒ හින්ද මගේ වහලුන් නිදහස් කර ගන්න එකී පැත්තකට දාල... නුඹලා නුඹලාගේ වැඩක් ..බලාගනිල්ලා...
එහෙත් ආරොන්ගේ ලී දණ්ඩෙන් බිහිවූ සර්පයා පාරාවෝගේ විජ්ජාකරුවන් හැදූ සර්පයන් සියල්ලම ගිල දැමුවේය...
..විමතියට පත් පාරාවෝ..
මේකනම් කොහොත්ම.. ..වෙන්න බෑ.. අපේ ඊශ්වර.. දෙවිවරුන්ටත් වඩා බලවත්ද... මුංගෙ මේ දෙවියන් වහන්සේ එය නම් කෙසේවත් විය නොහැකියි..
ඊශ්‍රායල් වරුනි ...ඔබයින්.. මගේ හිත වෙනස් කරන්න ..නැහැ..



# ගවලෙනේ කථාව අපේම පුංචි ඇසින් බලා අපි මෙලෙසින් කථා කරන්නෙමු !





ඡායාරූපය : අශේන් එස්. සේනාරත්න





